**දිළිඳුකම පිටුදැකීමේ නැගෙනහිර පළාත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - “ බී ” සංරචකය**

---------------------------------------------------------------------------------------------------

1. **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ ( යෙන් ) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වී ඇති බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකවූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.3,093 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.32,975,032 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

<u>දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය</u>
<u>සඳහා වියදම</u>

| වියදම් විෂයය | 2010 | 2009 | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | - | - | 932,857 |
| වැටුප් | - | 15,750 | 1,072,841 |
| ගමන් වියදම් | - | - | 23,932 |
| සැපයීම් හා අවශ්‍යතා | - | - | 781,243 |
| නඩත්තු | - | - | 3,735,125 |
| ගිවිසුම්ගත සේවා | - | - | 101,970 |
| පර්යේෂණ අධ්‍යයන සහ සංවර්ධන පුහුණුව | - | - | 24,909,287 |
| බැංකු ගාස්තු | 2,592 | 1,857 | 44,625 |
| සේවා ගාස්තු | 501 | - | 23,368 |
| වෙනත් | - | - | 1,349,784 |
| | 3,093 | 17,607 | 32,975,032 |

## 2.2 විශේෂ (යෙන්) ගිණුම

------------------------

මූල්‍ය ප්‍රකාශන වලට සහ ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය තුලදී විශේෂ (යෙන්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | ජපාන යෙන් | රු. |
|---|---|---|
| | --------------- | ---------- |
| 2010 ජනවාරි 01 දිනට ශේෂය | 24,406 | 30,295 |
| එකතු කළා | | |
| ------------------ | | |
| ඌනපූරණයන් | 396,600 | 500,826 |
| විදේශ විනිමය ලාභය | - | 41,910 |
| | -------------- | --------------- |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 421,006 | 573,031 |
| | ======== | ========= |

## 2.3 භෞතික කාර්යසාධනය

----------------------------

ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුල ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ වෘත්තීය පුහුණු වැඩ සටහන් 15 ක් යටතේ පාසැල් හැරගිය අයවලුන් 668 දෙනෙකු පුහුණු කිරීමට ව්‍යාපෘතය සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශිෂ්‍යයින් 621 දෙනෙක හෙවත් 93% පමණක් පුහුණු වැඩසටහන් නිම කර තිබුණි.

## 3. විගණන නිරීක්ෂණ

---------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2010 වර්ෂයේදී නිමවී තිබුණද, ව්‍යාපෘතිය නිම කිරීමේ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, වත්කම්ද ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයට මාරු කර නොතිබුණි.